**කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී උපාධි පළමු වසර පරීක්ෂණය**

**පළමු සෙමෙස්තරය 2023 / 2024**

# FND 1104 - කලාව හා සංස්කෘතිය පිළිබඳ ගැටලු

**පැ දෙකයි**

- ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

01. “කලාවේ කාර්යභාරය හා අරමුණ වනුයේ මිනිසාගේ මනස තුළ පසිඳුරන් ඔස්සේ සන්නිවේදන සබඳතාවක් ගොඩනගා ගැනීමයි.” ඔබ කැමති නිර්මාණයක් ඇසුරෙන් මේ අදහසට අදාළව විග්‍රහයක් කරන්න.

02. “කලාව විනෝදාස්වාදය, රසාස්වාදය මෙන් ම ජීවිත පරිඥානය ද ඇති කරවන මාධ්‍යයකි.” මේ අදහස පහත සඳහන් ගීතය ඔස්සේ සාකච්ඡා කරන්න.

දූවිල්ලෙන් සැදුන ලියේ
බාලොළියේ බාලලියේ

වෙණ වයනා මිනිසුන්ට
වීණාවක් ගෙනත් දෙන්න
දූවිල්ලෙන් සැදුන ලියේ
බාලොලියේ බාලලියේ

ගී ගයනා මිනිස්සුන්ට
පැන් තලියක් ගෙනත් දෙන්න
දූවිල්ලෙන් සැදුන ලියේ
බාලොලියේ බාලලියේ

ගී අහන්න මිනිස්සුන්ට
පන් පැදුරක් එලා දෙන්න
දූවිල්ලෙන් සැදුන ලියේ
බාලොලියේ බාලලියේ

03. **“අත්දැකීමක් සජීවී අන්දමින් චිත්තාකර්ෂණීය නිර්මාණයක් බවට පත් කිරීම කලාකරුවාගේ කාර්යභාරයයි.” සෝමරත්න දිසානායකගේ සරිගම සිනමා නිර්මාණය ඇසුරින් විභාග කරන්න.**

04. “මාර්ටින් වික්‍රමසිංහගේ උපන්දා සිට කෘතියෙහි ළමා විය ශ්‍රී ලංකාවේ එක් යුගයක ළමා දිවියෙහි චමත්කාරය මැනවින් ප්‍රකට කරයි.” නූතන ළමා පරපුර සම්බන්ධයෙන් මෙම අදහස විභාග කරන්න.

05. “රටක අධ්‍යාපනය වඩාත් වැදගත් වන්නේ එම රටේ අනාගත පරපුර මානව හිතවාදී වීමට පිටුබලයක් සපයන්නේ නම් පමණි. විෂම භාග සිනමා නිර්මාණය ඇසුරින් මේ මතය සනාථ කරන්න.